පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
**UNIVERSITY OF PERADENIYA**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக் கல்வி நிலையம்
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර-පැරණි) - 2019 ඔක්තෝබර්
முதற்கலைத்தேர்வு பரீட்சை (வெளிவாரி) -2019 டிசம்பர்
**GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL-old) October 2019**

## ආර්ථික විද්‍යාව I - (ECG 1)

**උපදෙස්:**
මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.
එක් කොටසකින් අවු තරමින් ප්‍රශ්න දෙකක්වත් තෝරා ගෙන ප්‍රශ්න (05 )**පහකට** පිළිතුරු සපයන්න
කාලය පැය (03) තුනක් පමණයි
ප්‍රස්ථාර කොළ සපයනු ලැබේ. ගණක යන්ත්‍ර භාවිතා කලහැක

## I - කොටස

1. මාසික ආදායම රු. 36.00 ක් ලබන පාරිභෝගිකයෙකුට X සහ Y භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍යව ඇත. ඒවායෙහි මුළු උපයෝගිතා ශ්‍රිත පහත සමීකරණ මගින් දී ඇත..

$$TU_x = 50Q_x - 5Q_x^2$$

$$TU_y = 32Q_y - 4Q_y^2$$

X ඒකකයක මිල රු. 05/= ක්ද, Y ඒකකයක මිල රු. 0ග4/= ක්ද වේ යැයි සිතන්න.

i. පාරිභෝගිකයාගේ සමතුලිත මිලදී ගැනීම් ගණනය කරන්න . (ලකුණු 05)
ii. මෙම සමතුලිතතාවයෙහි අදහස ඔබ පැහැදිලි කරන්නේ කෙසේද? (ලකුණු 05)
iii. සමතුලිතතාවයෙහිදී මුදලේ ආන්තික උපයෝගිතාවය ගණනය කරන්න. (ලකුණු 05)
iv. අනෙකුත් දේ ස්ථාවරව තිබියදී X භාණ්ඩයෙහි මිල රු. 2/= කින් වැඩිවීයැයි සිතන්න. එවිට ඔහුගේ නව සමතුලිත මිලදී ගැනීම් කුමක් විය යුතුද? (ලකුණු 05)

2. i. පාරිභෝගික ඉල්ලුම් න්‍යායට අදාල උපයෝගිතා ප්‍රවේශය සහ උපේක්ෂා වක්‍ර ප්‍රවේශය අතර සම්බන්ධතාවය පැහැදිලි කරන්න. (ලකුණු 10)
ii. මෙම ප්‍රවේශයන් දෙකෙන් වඩාත් යෝග්‍ය ප්‍රවේශය කුමක්දැයි ඔබ සිතන්නේද? ඒ ඇයි? (ලකුණු 05)
iii. ඉහත ප්‍රවේශයන් දෙකෙන් එකක් භාවිතා කරමින් ඔබ ඉල්ලුම් වක්‍රය ව්‍යුත්පන්න කරන්නේ කෙසේද? (ලකුණු 05)

3. පූර්ණ තරඟකාරී ආයතනයක පිරිවැය සහ ආන්තික ප්‍රතිලාභ වක්‍ර භාවිතා කරමින් පහත දැක්වෙන ඒවා පෙන්නුම් කර විස්තර කරන්න.

i. ආයතනය සාමාන්‍ය ලාභ ලැබීම (ලකුණු 04)
ii. ආයතනය ආර්ථික ලාභ ලැබීම (ලකුණු 04)
iii. ආයතනය තාවකාලිකව වසාදැමීමට තීරණය කිරීම (ලකුණු 06)
iv. ආයතන තරඟකාර වෙළඳපලක් තුල දිගු කාලීනව සාමාන්‍ය ලාභ ලැබීම (ලකුණු 06)

4. i. ශ්‍රමය සඳහා ඉල්ලුම තීරණයවීමට බලපාන සාධක මොනවාද? (ලකුණු 08)

ii. තරඟකාරී ශ්‍රම වෙළඳපලක වැටුප් තීරණය වන්නේ කෙසේද? එය ඒකාධිකාරී වෙළඳපලක වැටුප් තීරණය වන ආකාරයෙන් වෙනස් වන්නේද? (ලකුණු 12)

5. පහත සඳහන් ඒවා පිළිබඳව කෙටි සටහන් ලියන්න..

i. ආදායම් පරිභෝජන වක්‍රය

ii. සම නිෂ්පාදිත වක්‍රය සහ ආන්තික ශිල්පීය ආදේශන අනුපාතිකය

iii. හීනවන ආන්තික ඵලදායිතා නියමය

iv. ඒකාධිකාරී තරඟකාරී ආයතනයක ධාරිතා උපයෝජනය (එක් කොටසකට ලකුණු 05 බැගින්)

## II – කොටස

6. ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත දැක්වෙන තොරතුරු සලකන්න. (වටිනාකම් රු. මිලියන වලිනි).

| | |
|---|---|
| පරිභෝජනය | $C = 180 + 0.8\,Y^d$ ($Y^d$ වැයකලහැකි ආදායම) |
| පෞද්ගලික ආයෝජන | $\bar{I} = 300$ |
| රජයේ වියදම | $\bar{G} = 400$ |
| සෘජු බදු | $T = 100 + 0.25Y$ |
| ශුද්ධ අපනයන | $(X-M) = 200$ |

i. මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 05)

ii. ආදායම් ගුණකයෙහි අගය ඇස්තමේන්තු කරන්න. (ලකුණු 05)

iii. පෞද්ගලික ආයෝජන රු. 200 කින් පහල ගියේයැයි සිතන්න. නව සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 05)

iv. සමතුලිතයේදී රාජ්‍ය අයවැය හිඟය ගණනය කරන්න. (ලකුණු 05)

7. i. ඉහල ද.ජා.නි. (GDP) මට්ටමක් ලඟා කරගැනීමෙහිලා මූල්‍ය ප්‍රතිපත්තියෙහි කාර්යභාරය කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

ii මූල්‍ය පදනමෙහි (*Monetary Base*) සංරචක පැහැදිලි කරන්න. මූල්‍ය පදනමට බලපාන සාධක මොනවාද? (ලකුණු 10)

8 i. නිරපේක්ෂ වාසි න්‍යාය සහ සාපේක්ෂ පිරිවැය න්‍යාය අතර වෙනස්කම් සැසඳීමක් කරන්න. (ලකුණු 08)

ii. නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයෙහි වාසි සහ අවාසි කෙටියෙන් දක්වන්න. (ලකුණු 12)

9 i. ගෙවුම් ශේෂයෙහි හිඟය පිළිබඳ සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. විනිමය අනුපාතික ක්‍රමයක් ඇතිකර ගැනීමට සහ එය පවත්වා ගැනීමෙහිලා බ්‍රෙට්න් වුඩ් ක්‍රමයෙහි කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

10 පහත සඳහන් ඒවා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. ආදායම් ගුණකය තීරණයවීම

ii. පිස්කල් හිඟය සහ වෙළඳ ශේෂය

iii. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

iv. ස්වාධීන වියදම් සහ පෙළඹවුණු වියදම් (එක් කොටසකට ලකුණු 05 බැගින්)